**Provincial Department of Education- Sabaragamuwawa**

**Sathi Pasala**

Subject: JAPANESELANGUAGE

Week: 04

Prepared by: K.O.Premathilake, Kuruwita Central Collage

Grade: 12

# 第１−３ 課　水泳(すいえい)が好(す)きです。

## Aim

කෙනෙකු ගේ රුචි අරුචිකම්, අකමැති දේවල්,ශක්තීන් සහ දුර්වලතා ප්‍රකශ කිරීමට හැකි වීම

Words

りんご、クリケット、ケーキ、 スキー、ダンス、テニス、

嫌(きら)い、好(す)き

運転(うんてん)、絵(え)、映画(えいが)、水泳(すいえい)、数学(すうがく)、 洗濯(せんたく)、掃除(そうじ)、卵(たまご)、得意(とくい)、何(なん)、苦手(にがて)、肉(にく)、 日本語(にほんご)、豚肉、

勉強(べんきょう)、野菜(やさい)、料理(りょうり)

Focus on

## N1 は N2 が 好きです。

යම් කිසි දෙයකට කැමැත්ත ප්‍රකාශ කිරීම,අකමැත්ත ප්‍රකාශ කිරීම,තමාගේ ශක්තීන් හා දුර්වලතා පිළිබඳව ප්‍රකාශ කිරිමේදී මෙය භාවිත කරයි.

එසේ ප්‍රකාශ කිරීමේ දී තමා කැමති,අකමැති,ශක්තීන් හෝ දුර්වලතාවය ට අදාළ වචනයට පසුව が නිපාතය යොදා එයට好(す)きです හෝ 嫌(きら)いです හෝ 得意(とくい)です හෝ 苦手(にがて)です එකතු කරනු ලැබේ.

れい:

1. 私(わたし)は水泳(すいえい)が好(す)きです。


   මම පිහිනීම ට කැමතියි.

2. ラーダーさんは肉(にく)が好(す)きではありません。

   ගීතා මස් වලට කැමති නැහැ.

3. 私(わたし)も肉(にく)が好(す)きではありません。

   මමත් මස් වලට කැමති නැහැ.



4. ラーダーさんと私(わたし)は肉が好(す)きではありません。

   ගීතා සහ මම මස් වලට කැමති නැහැ.

と යන නිපාතයෙන් සහ යන අර්ථය කියැවේ.

5. A: あなたは水泳(すいえい)が好(す)きですか

   ඔබ පිහිනීමට කැමතියි ද ?

   B: はい、好(す)きです。

   ඔව්, මම කැමතියි.



（いいえ、好(す)きじゃありません）

නැහැ, මම කැමති නැහැ.

6. A: あなたの友達(ともだち)は何(なに)が好(す)きですか。

ඔබගේ මිතුරිය මොනවටද කැමති?

B: 彼女(かのじょ)はクリケットが好(す)きです。

ඇය ක්‍රිකට් වලට කැමතියි




これをシンハラ語(ご)に翻訳(ほんやく)してください。

මෙය සිංහල භාෂාවට පරිවර්තනය කරන්න.



サチニ ：カスンさん あなたは何(なに)が得意(とくい)ですか

カスン：私は運転が得意ですよ。サチニ さんあなたは？

サチニ 私はダンスが得意ですね。

カスン：そうですか。

- 第 1ー3 課の practice A, B, C, D, E をしなさい。[Page 13, 14 grade12 part1]

**Provincial Department of Education- Sabaragamuwawa**

**Sathi Pasala**

: SubjectJAPANESELANGUAGE

Week: 04

Grade: 12

Prepared by: K. O. Premathilake, Kuruwita Central Collage

# Unit 2-1 ひらがな（はんだくおん、だくおん）

## හිරගනා අකුරු ලියමු

## Aim

*හිරගනා අක්ෂර නිවැරදි ව හඳුනා ගනිමින් අක්ෂර ලිවීමේ රීති වලට අනුකූලව ලිවීම සහ නිවැරදි ව කියවීම.*




| | | |
|---|---|---|
| かきくけこ<br>ka ki ku ke ko | | がぎぐげご<br>ga gi gu ge go |
| さしすせそ<br>sa shi su se so | go full dakuten or go home space of blankness | ざじずぜぞ<br>za ji zu ze zo |
| たちつてと<br>ta chi tsu te to | | だぢづでど<br>da di dzu de do |
| はひふへほ<br>ha hi fu he ho | ぱぴぷぺぽ<br>pa pi pu pe po | ばびぶべぼ<br>ba bi bu be bo |

| | | | | |
|---|---|---|---|---|
| ga | gi | gu | ge | go |
| が | ぎ | ぐ | げ | ご |
| za | ji | zu | ze | zo |
| ざ | じ | ず | ぜ | ぞ |
| da | ji | zu | de | do |
| だ | ぢ | づ | で | ど |
| ba | bi | bu | be | bo |
| ば | び | ぶ | べ | ぼ |
| pa | pi | pu | pe | po |
| ぱ | ぴ | ぷ | ぺ | ぽ |

ඉහත ආකාරයට ක, කි, කු, කෙ, කො අකුරු වලට තෙන් තෙන් එනම් අදාළ අකුරට උඩින් කුඩා ඉරි කෑලි 2ක් දැමීමෙන් ඒවා ග, ගි, ගු, ගෙ, ගො බවට පත් කළ හැක.

**Ka + තෙන් තෙන් ゛ = Ga**

**か + ゛ = が**




ඒ ආකාරයට ම ස, ශි, සු, සෙ, සො අකුරු වලට තෙන් තෙන් දැමූ විට ඒවා za, ji, zu, ze, zo බවට පත් වේ. මෙහි දී し අකුරට තෙන් තෙන් දැමීමේ දී එය බවට පත් වේ. じ

භාවිත කරන බොහෝ අවස්ථා වලදී භාවිතා වන්නේ මෙම අකුරයි.




ඒ ආකාරයට ම ත, චි, ත්සු, තෙ, තො අකුරු වලට තෙන් තෙන් දැමූ විට ඒවා da, ji, dzu, de, do බවට පත් වේ. මෙහි දී ち අකුරට තෙන් තෙන් දැමීමේ දී එය ち " බවට පත් වේ. මෙම අකුර එතරම් භාවිතයේ නොමැත.



හ, හි, හු, හෙ, හො අකුරු වලට තෙන් තෙන් දැමූ විට ඒවා ba, bi, bu, be, bo බවට පත් වේ.




## よつがな じ සහ ち゛, ず සහ つ゛

සමාන උච්චාරණයක් සඳහා වෙනස් අක්ෂර කිහිපයක් පැවතීම මෙනමින් හැඳින්වේ.මෙහිදී යෙදෙන වචනය මත අකුරෙහි වෙනස්වීම් රඳා පවතී.


1. සමාන ශබ්ද දෙකක් එක ළග යෙදෙන විට දෙවන ශබ්දය සඳහා යෙදෙනුයේ කලින් ශබ්දයේ ම ඝෝෂ ස්වරූපයයි.

   උදා: つつ゛ける、ちちむ


2. වචන දෙකක් එකතු වී සෑදුණු තනි වචන

   උදා:はなち゛、てつ゛くり

ප, පි, පු, පෙ, පො අකුරු නිර්මාණය වන්නේ හ, හි, ෆු, හෙ, හො යන අකුරු වලට maru, まる එකතු වීමෙනි. එනම් අදාළ අකුරේ දකුණු පස ඉහලින් කුඩා රවුමක්, කුඩා බෝලයක් දමනු ලැබේ.



එසේ දැමීමෙන් හ, හි, ෆු, හෙ හා හො අකුරු ප, පි, පු, පෙ, පො බවට පත් වේ.




ඔබ ගේ 日本語の文字 පෙළ පොතෙහි පිටු අංක 15 සිට 20 දක්වා ඇති අභ්‍යාස කරන්න.

**Provincial Department of Education- Sabaragamuwawa**

**Sathi Pasala**

Subject: JAPANESELANGUAGE

Week: 04

Grade: 12

Prepared by: K. O. Premarhilake,
Kuruwita Cenrtal Collage

# Unit 2-1 ひらがな

## හිරගනා අකුරු ලියමු


**Aim**


*හිරගනා අක්ෂර නිවැරදි ව හඳුනා ගනිමින් අක්ෂර ලිවීමේ රීති වලට අනුකූලව ලිවීම සහ නිවැරදි ව කියවීම.*


| | | | |
|---|---|---|---|
| H | ひゃ hya | ひゅ hyu | ひょ hyo |
| P | ぴゃ pya | ぴゅ pyu | ぴょ pyo |
| B | びゃ bya | びゅ byu | びょ byo |
| K | きゃ kya | きゅ kyu | きょ kyo |
| G | ぎゃ gya | ぎゅ gyu | ぎょ gyo |
| S | しゃ sha | しゅ shu | しょ sho |
| J | じゃ ja | じゅ ju | じょ jo |
| C | ちゃ cha | ちゅ chu | ちょ cho |
| N | にゃ nya | にゅ nyu | にょ nyo |
| M | みゃ mya | みゅ myu | みょ myo |
| R | りゃ rya | りゅ ryu | りょ ryo |

Kya, kyu, kyo, sha, shu, sho යනාදී යන ශබ්ද ලියනු ලබන්නේ එම අදාළ අක්ෂරයේ “ඉ” ශබ්දයට පසුව や、ゆ、よ යන අක්ෂර එකතු කිරීමෙනි. මෙහි දී や、ゆ、よ අක්ෂර කුඩා කොට ලියනු ලැබේ.

れい：




මේ ආකාරයට ය යු, යො අකුරු කුඩා කොට ලියනු ලැබේ.

| | | | | | |
|---|---|---|---|---|---|
| きゃ<br>kya | きゅ<br>kyu | きょ<br>kyo | ぎゃ<br>gya | ぎゅ<br>gyu | ぎょ<br>gyo |
| しゃ<br>sha | しゅ<br>shu | しょ<br>sho | じゃ<br>ja | じゅ<br>ju | じょ<br>jo |
| ちゃ<br>cha | ちゅ<br>chu | ちょ<br>cho | | | |
| にゃ<br>nya | にゅ<br>nyu | にょ<br>nyo | | | |
| ひゃ<br>hya | ひゅ<br>hyu | ひょ<br>hyo | びゃ<br>bya | びゅ<br>byu | びょ<br>byo |
| みゃ<br>mya | みゅ<br>myu | みょ<br>myo | ぴゃ<br>pya | ぴゅ<br>pyu | ぴょ<br>pyo |
| りゃ<br>rya | りゅ<br>ryu | りょ<br>ryo | | | |

Hiragana

ඊතල වලින් දක්වා තිබෙන අක්ෂර කියවීමේ දී ඒවා sha, shu, sho සහ cha, chu, cho ලෙසට කියවනු ලැබේ.

- ඔබ ගේ 日本語の文字 පෙළ පොතෙහි පිටු අංක 22,23 හි ඇති අභ්‍යාස කරන්න.

**Provincial Department of Education- Sabaragamuwawa**

**Sathi Pasala**

Subject: JAPANESELANGUAGE

Week: 04

Grade: 12

Prepared by: K. O. Premathilake ,Kuruwita Central Collage

Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School

# Unit 1 - 2 ひらがな

## හිරගනා අකුරු ලියමු (දීර්ඝ අක්ෂර)

**Aim :** *හිරගනා අක්ෂර නිවැරදි ව හඳුනා ගනිමින් අක්ෂර ලිවීමේ රීති වලට අනුකූලව ලිවීම සහ නිවැරදි ව කියවීම.*

1. あ、か、さ、た、な、は、ま、や、ら、わ යන අක්ෂර වල එම අක්ෂරයට පසුව තවත් あ අකුරක් එකතු කිරීමෙන් දීර්ඝ අක්ෂරය ලියනු ලැබේ.

れい:

Okāsan = o + ka + a + sa + n
お + か + あ + さ + ん } おかあさん

おばあさん = お + ば + あ + さ + ん = おばあさん

2. い、き、し、ち、 に、 ひ、み、り යන අක්ෂර වල එම අක්ෂරයට පසුව තවත් い අකුරක් එකතු කිරීමෙන් දීර්ඝ අක්ෂරය ලියනු ලැබේ.

れい:

た ＋ の ＋ し ＋ い ＝ たのしい

ち ＋ い ＋ さ ＋ い ＝ ちいさい

3. う、く、す、つ、ぬ、ふ、む、ゆ、る යන අක්ෂර වල එම අක්ෂරයට පසුව තවත් う අකුරක් එකතු කිරීමෙන් දීර්ඝ අක්ෂරය ලියනු ලැබේ.

れい:

ゆうめいな、ふうせん

4. え、け、せ、て、ね、へ、め、れ යන අක්ෂර වල දීර්ඝ අක්ෂර සාදා ගැනීමේ දී බොහෝ අවස්ථා වලදී එම අක්ෂරයට පසුව බොහෝ විට い අක්ෂරය එකතු කල යුතු වේ. එමෙන්ම い වෙනුවට え අක්ෂරය එකතු කරන අවස්ථා ද කලාතුරකින් දක්නට ලැබේ.

れい:

えいが
けいさつ } い යෙදෙන අවස්ථා

おねえさん ＝ යෙදෙන අවස්ථා

5. お、こ、そ、と、 の、ほ、も、よ、ろ යන අක්ෂර වල දීර්ඝ අක්ෂර සාදා ගැනීමේ දී බොහෝ අවස්ථා වලදී එම අක්ෂරයට පසුව බොහෝ විට う අක්ෂරය එකතු කල යුතු වේ. නමුත් い වෙනුවට お අක්ෂරය එකතු කරන අවස්ථා ද කලාතුරකින් දක්නට ලැබේ.

れい：

むこう

きのう

くうこう

おはよう

う යෙදෙන අවස්ථා

おおい

とおい

おおきい

こおり

お යෙදෙන අවස්ථා

6. きゃ、きゅ、きょ… ආදී අක්ෂර වල දීර්ඝ අක්ෂරය සාදා ගැනීම සඳහා ඉහත අක්ෂර සඳහා භාවිතා කළ රටාව ම අනුගමනය කරනු ලැබේ.

きゅうけい

しゅうまつ

にんぎょう

きょうしつ



## හල් අකුරු ලිවීම / ද්විත්ව ව්‍යංජන ලිවීම

කුඩා ත්සු අකුර යෙදීම මගින් හල් අකුරු දක්වනු ලබයි.

れい:がっこう ,いっぱい、よっつ

ත්සු අක්ෂරය තනි අක්ෂරය වන නිසා මෙම කුඩා ත්සු අක්ෂරය වෙත අපගේ විශේෂ අවධානය යොමු කල යුතුයි. මෙහි දී කුඩා ත්සු අක්ෂරය ද එක් අක්ෂරයක් ලෙස සැලකිය යුතුයි.

## ん භාවිතා කිරීම

මෙය ශබ්ද කරනුයේ න් හෝ ම් ලෙසයි.

じゅんび = jumbi

はんたい = hantai

さんか = sanka

すみません = sumimasen

ඔබ ගේ 日本語の文字 පෙළ පොතෙහි පිටු අංක 26,27 හොදින් කියවා 28 හි ඇති අභ්‍යාස කරන්න.